පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 774 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 07/05/2024<br>පැය 1520 |

# මාධ්‍ය නිවේදනය

## පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01.** **2024.05.06 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 05 | 05 | 292 | 470 | බුලි 01<br>යකඩ බැරල් 06<br>ගෑස් සිලින්ඩර් 01<br>ගෑස් ලිප් 01<br>තඹ දඟර 03 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර**

2024.05.07 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ වේල්ලවත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 01 ග්‍රෑම් 12 ක්, ඩිජිටල් තරාදියක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මත්ද්‍රව්‍ය නාශක කාර්යංශය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 30 ක් වූ කොළඹ 14 ප්‍රදේශයේ** පදිංචිකරුවෙකු වේ. මත්ද්‍රව්‍ය නාශක කාර්යංශය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර**

2024.05.06 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කඩවත පොලිස් වසමේ කොළඹ - කෙරවලපිටිය අධිවේගී පිවිසුම් අසළදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 650 ක් හා එම ජාවාරමෙන් උපයා ගන්නා බවට සැකකරන මුදල් 8400/- ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මත්ද්‍රව්‍ය නාශක කාර්යංශය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 35 ක් වූ පමුණුවත්ත** ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. මත්ද්‍රව්‍ය නාශක කාර්යංශය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුර.**

2024.05.06 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුරේ නිලධාරීන්ට නිලධාරීන් කණ්ඩායමක් විසින් පලාලි පොලිස් වසමේ ආවලි හන්දිය ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මත්කරල් 200 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පලාලි පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 30 ක් වූ මල්ලාකම් උතුර** ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. පලාලි පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. බලපත්‍ර නොමැතිව කැබ් රථයකින් දැව කඳන් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පරයනාලන්කුලම් කඳවුර.**

2024.05.06 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පරයනාලන්කුලම් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ඊච්චන්කුලම් පොලිස් වසමේ කල්මඩු හංදිය ආසන්න ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව කැබ් රථයකින් බුරුත දැව කඳන් 11 ක් ප්‍රවාහනය කරමින් සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඊච්චන්කුලම් පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 20 ක් වූ වව්නියාව** ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. ඊච්චන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06. අනවසරයෙන් රක්ෂිතයකට ඇතුළු වී කැළය කපා භූමිය එළි පෙහෙළි කළ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුර.**

2024.05.06 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වාකරේ පොලිස් වසමේ කදිරවේලි රක්ෂිතයේ කුලාවලිවෝල ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර **අනවසරයෙන් රක්ෂිතයට ඇතුළු වී කැළය කපා භූමිය එළි පෙහෙළි කළ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වාලච්චේන අඩවි වන කාර්යාලය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 53 ක් වූ කදිරවේලි ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

## 07. මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මහඔය කඳවුර.

2024.05.06 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මහඔය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පදියතලාව පොලිස් වසමේ සියඹලාගස්පිටිය ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක් සමඟ සැකකරුවන් දෙදෙනකු** අත්අඩංගුවට ගෙන පදියතලාව පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 38ක් හා 41 ක් වූ මහියංගනය ප්‍රදේශයේ** පදිංචිකරුවන් වේ. පදියතලාව පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 08. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වව්නියාව කඳවුර.

2024.05.06 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වව්නියාව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වව්නියාව පොලිස් වසමේ තාන්ඩිකුලම ඒ 09 මාර්ගය ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **ගංජා කිලෝ ග්‍රෑම් 05 ග්‍රෑම් 124 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වව්නියාව පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 26 ක් වූ වව්නියාව ප්‍රදේශයේ** පදිංචිකරුවෙකු වේ. වව්නියාව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**